(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(10).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 සැප්තැම්බර් 12 සිකුරාදා**

**2025 සැප්තැම්බර් 23 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 15 දිනැති අංක 2449/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.09.12 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2025 සැප්තැම්බර් 24 බදාදා)**

328/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරක්ෂක අමාත්‍යාංශයට මේ වනවිට පත් කර ඇති උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම උපදේශකයන්ගේ කාර්යභාරය කවරේද;

(iii) එම එක් එක් උපදේශකයාට ගෙවනු ලබන මාසික වැටුප් හා දීමනා, පෙර සේවා ස්ථානය/ස්ථාන, අවසන්වරට දරන ලද තනතුර, අධ්‍යාපන සුදුසුකම් සහ 2024 වර්ෂය වනවිට වයස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම උපදේශකයන්ට කාර්ය මණ්ඩලයක් ලබාදී තිබේද;

(v) එසේ නම්, එම එක් එක් උපදේශකයාගේ කාර්ය මණ්ඩල සේවකයන්ගේ නම්, ඔවුන්ගේ තනතුරු, ඔවුන්ගේ මාසික වැටුප් හා දීමනා සහ එම සේවකයන් අනුයුක්ත කර තිබේ නම්, ඔවුන්ගේ මුල් සේවා ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

543/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැබිනට් අමාත්‍යාංශ සඳහා පත් කර ඇති මුළු උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් උපදේශකයාගේ නම, පත් කරන ලද දිනය, අධ්‍යාපන සුදුසුකම්, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් වාහනයේ අංකය, වාහනයේ වර්ගය, වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව, ඔහුට/ඇයට කාර්යාලයක් ලබාදී තිබේ නම් එම කාර්යාලය පිහිටි ස්ථානය සහ එම කාර්යාලය සඳහා ගෙවනු ලබන මාසික කුලිය එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

545/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පත් කර ඇති එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, පත් කරන ලද දිනය, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, එම වැටුප පෞද්ගලික බැංකු ගිණුමකට බැර නොවන්නේ නම් එය බැර කරනු ලබන බැංකුව, ගෙවනු ලබන වෙනත් දීමනා, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් එම වාහනයේ අංකය, වාහනයේ වර්ගය සහ වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

546/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු වන අමාත්‍යවරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පත් කර ඇති එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, පත් කරන ලද දිනය, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, එම වැටුප පෞද්ගලික බැංකු ගිණුමකට බැර නොවන්නේ නම් එය බැර කරනු ලබන බැංකුව, ගෙවනු ලබන වෙනත් දීමනා, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් එම වාහනයේ අංකය, වාහනයේ වර්ගය සහ වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1298/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට මේ දක්වා රැකියා සඳහා විදේශගතවූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව, ඔවුන් විසින් ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණය සහ එම විදේශ විනිමය ප්‍රමාණය ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගෙන් ඉහළ ඉල්ලුමක් පවතින රටවල් කවරේද;

(iii) එම ඉල්ලුම සපුරාලීම සඳහා රජය සතු වැඩපිළිවෙළ කවරේද;

(iv) 2020 වර්ෂයේ සිට මේ දක්වා ඉහත(ii)හි සඳහන් රටවල රැකියා සඳහා යොමු කර ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට වැඩි ප්‍රතිලාභ අත්වන ශ්‍රම වෙළඳපොළක් පවතින රටවල් කවරේද;

(vi) එම රටවලට ඉහළ නිපුණතාවයකින් යුත් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යොමු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 සැප්තැම්බර් 26 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 ඔක්තෝබර් 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1024/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන ප්ලාස්ටික් හා පොලිතින් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්ලාස්ටික් හා පොලිතින් භාවිතය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ප්ලාස්ටික් යොදා නිෂ්පාදනය කරනු ලබන කුඩා දරුවන්ගේ ආහාර අසුරණවල ප්‍රමිතිය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1083/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන්නි ප්‍රදේශයේ සිදු කරනු ලබන ගල් කැඩීමේ සහ පස් කැපීමේ කටයුතු සඳහා පළාත් සභා පරිපාලනයට අයත් කිසිදු ආයතනයකින් අවසර නොගෙන සෘජුවම මධ්‍යම රජයේ ආයතනවලින් අනුමතිය ලබා ගන්නා බවත්;

(ii) එම ක්‍රියාවලියේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන සම්බන්ධ වන බවත්;

(iii) කැනීම් කරන ඛනිජ සම්පත් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා මාර්ග පළාත් පාලන ආයතනවල පරිපාලනයට අයත් වන අවස්ථාවලදී පමණක් අදාළ පළාත් පාලන ආයතනයේ අනුමතිය ලබා ගන්නා බවත්;

(iv) ඒ අනුව, උතුරු පළාතේ සම්පත් පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල අනුමතියකින් තොරව පිට පළාත්වලට ගෙන යන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල අනුමතියකින් තොරව උතුරු පළාතේ සම්පත් පිට පළාත්වලට ගෙන යාමට ඉඩ දෙන්නේද;

(ii) මෙම තත්ත්වය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන විකල්ප වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1090/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයේ, පන්ති කාමර 17ක් හා වෙනත් වැදගත් කාර්යාල පවත්වා ගෙන යන ලද තෙමහල් ගොඩනැගිල්ලේ පහළ මාලයේ පැවති පන්ති කාමර දෙකකට හානි වන සේ පස් කන්දක් කඩා වැටීම හේතුවෙන් එම ගොඩනැගිල්ල භාවිතයෙන් ඉවත් කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම පාසලේ අධ්‍යාපන කටයුතු අඩාලවී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට පසුගිය කාලය තුළ පියවර ගෙන තිබුණේද;

(ii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඊට අදාළ භූමිය සංරක්ෂණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1102/2025

ගරු සුරංග රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2025.01.01 දින වනවිට ශ්‍රී ලංකාවේ රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්තමාන රජය විසින් උපාධිධාරීන්ට ලබාදී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) එම රැකියා සංඛ්‍යාව එක් එක් ක්ෂේත්‍රය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ඉදිරි වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට පවතින රජයේ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1114/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

(iii) එම අධිකාරියට අයත් ඉඩමක් Sweet Bay ප්‍රදේශයේ තිබේද;

(iv) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(v) එම ඉඩමේ අනවසරයෙන් වැටක් ඉදිකර බලහත්කාරයෙන් රැඳී සිටින සමාගම කවරේද;

(vi) එම ඉඩම සම්බන්ධයෙන් ඉහත සමාගමට අයිතියක් තිබේද;

(vii) නොඑසේ නම්, එම සමාගමට එරෙහිව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1161/2025

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් සහ මන්නාරම මහ රෝහල්වල වෛද්‍යවරුන් සඳහා වූ සීමාවාසික පුහුණුව ලබා නොදෙන බව දන්නේද;

(ii) බොහෝ මූලික රෝහල්වල වෛද්‍ය සභාවේ අනුමත විශේෂඥ වෛද්‍යවරුන් සිව්දෙනෙකුට වඩා සේවය කරනු ලැබුවද, මුලතිව් සහ මන්නාරම මහ රෝහල්වල පවතින විශේෂඥ වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු නොපිරවීමට හේතු කවරේද;

(iii) ප්‍රමාණවත් සම්පත් නොමැති වීම හේතුවෙන් මූලික වෛද්‍ය පරීක්ෂණ සහ වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා රෝගීන් වෙනත් දිස්ත්‍රික් රෝහල් වෙත යැවීමෙන් රජයේ සෞඛ්‍ය සේවාවේ අසමත්භාවය සහ අසමානතාවය සනාථ වන බව පිළිගන්නේද;

(iv) ඉහත රෝහල් ඇතුළුව ශ්‍රී ලංකාවේ තිබෙන සියලුම දිස්ත්‍රික් රෝහල්වලට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ භෞතික සම්පත් පැවතීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1251/2025

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලේඛන ගත කර ඇති වැව් සහ ගංගා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන, මාතර දිස්ත්‍රික්කයේ ඇති වැව්, ගංගා හා ඇළ මාර්ග සංඛ්‍යාව සහ ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මාතර සහ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, නිල්වලා ගඟ නිම්නය ආශ්‍රිතව වාරි රක්ෂිත වෙන් කර තිබේද;

(v) ඒවා වෙනත් පාර්ශ්ව විසින් අත්පත් කරගෙන ඇති බව දන්නේද;

(vi) එසේ නම්, ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාදුගල ග්‍රාම නිලධාරී වසමේ නිල්වලා ගඟ ව්‍යාපාරයට අත්පත් කරගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ වෙනුවෙන් වන්දි දී තිබේද;

(iii) වන්දි ගත් පුද්ගලයන් විසින් එම ඉඩම් වෙනත් පාර්ශ්වයන්ට විකුණා ඇති බව දන්නේද;

(iv) නිල්වලා ගඟ ව්‍යාපාරය ඉදිරියටත් ක්‍රියාත්මක කරන්නේද;

(v) නොඑසේ නම්, අත්පත් කරගත් ඉඩම් නැවත මුල් අයිතිකරුවන්ට ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1282/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු සියලුම ඉඩම් නිශ්චිතව වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා, නමුත් 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව භාවිතයට ගැනීමට හැකියාවක් ඇති ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ වර්තමාන හිමිකමේ ස්වභාවය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, කොමිෂන් සභාව සතු සියලුම ඉඩම් සඳහා හිමිකම් පත්‍ර සහ පිඹුරු පත්‍ර ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඒවායේ වලංගු කාලය කොපමණද;

(iii) ඉඩම් නොමැති හෝ නැවත පදිංචි කරන පුද්ගලයන් සඳහා කොමිෂන් සභාවේ ඉඩම් නිදහස් කිරීමට හැකිද;

(iv) එසේ නම්, ඊට අදාළ ක්‍රියාපටිපාටිය කවරේද;

(v) බදු පදනම මත ලබාදී ඇති කොමිෂන් සභාවේ ඉඩම්, අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා කර නොමැති නම්, නැවත පවරා ගැනීමට හැකිද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1306/2025

ගරු චානක මාදුගොඩ මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වනවිට උග්‍ර පානීය ජල හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම පානීය ජල හිඟය විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) පසුගිය රජය විසින් ගාල්ල, වක්වැල්ල ජල පොම්පාගාරයේ, ජල ඝන ලීටර 50,000ක ධාරිතාවයකින් යුතු ජල ටැංකියක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද බව දන්නේද;

(iv) එම ජල ටැංකිය ඉදිකිරීමේ කටයුතු අතරමග නතර වීමට බලපාන ලද හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1329/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් මඟින් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් සිදු කරන බව පිළිගන්නේද;

(iii) මේ වනවිට එම රෝහල්වල පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම රෝහල් තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ඔක්තෝබර් 08 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1180/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි නගර මධ්‍යයේ සතොස වෙළඳසැල පිහිටුවා ඇති ගොඩනැගිල්ල නිසි අනුමතියකින් තොරව ඉදිකර ඇති බව දන්නේද;

(ii) ඉදිකිරීම් සඳහා අදාළ අනුමතිය කරෙයිච්චි ප්‍රාදේශීය සභාවෙන් නිසි පරිදි ලබා ගෙන තිබේද;

(iii) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රජයේ මුදල් වැය කර තිබේ නම්, ඒ සඳහා මිල ගණන් කැඳවන ලද විස්තර කවරේද;

(iv) ඉදිකිරීම් සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියනවලින් කොපමණද;

(v) ඉහත ගොඩනැගිල්ලේ වර්තමාන හිමිකරු කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ල පිහිටුවා ඇති භූමියේ හිමිකාරිත්වය සතු ආයතනය කවරේද;

(ii) එම ඉඩම දීර්ඝ කාලීන බදු පදනම මත යම් පාර්ශ්වයකට ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

1235/2025

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදා සේවයේ නියුක්තව සිට, නිවාඩු ලබා නොගෙන විවිධ හේතු මත සේවය අතහැර ගොස් විදේශ ගතවී සිටින නිලධාරීන් සංඛ්‍යාව සහ සෙසු නිල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) පසුගිය රජය අවධියේදී පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඔවුන් විදේශ ගතවී ඇති අතර විවිධ රැකියාවල නිරත වෙමින් මේ වනවිට ඔවුන් ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමයක් උපයා දෙන බව පිළිගන්නේද;

(iii) ඔවුන් නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වී නොමැති බැවින් නැවත ශ්‍රී ලංකාවට පැමිණීමේදී අත්අඩංගුවට ගනු ලබන බව දන්නේද;

(iv) එසේ අත්අඩංගුවට ගනු ලබන ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(v) ඔවුන්ව නීත්‍යාකූලව හමුදා සේවයෙන් ඉවත් කිරීම සඳහා ගත වන කාලය අවම කර ගැනීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1258/2025

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ මේ වනවිට රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැඳවියන් අතරින් වර්ෂ 20ක රැඳවුම් කාලයකින් පසු නිදහස ලැබීමට නියමිත රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 20ක කාලය සම්පූර්ණ වීමෙන් පසු එම රැඳවියන් නිදහස් කරන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත රැඳවියන් හැර දඩ ගෙවීමට නොහැකිව දීර්ඝ කාලීනව බන්ධනාගාර ගත කර සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් සාධාරණ හා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1271/2025

ගරු සුදත් බලගල්ල මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහියංගනය ප්‍රාදේශීය සභාව විසින් පාලනය කරනු ලැබූ සතිපොළ ඉවත් කර එම ස්ථානයේ වෙළෙඳ සංකීර්ණයක් ඉදිකර ඇති බව දන්නේද;

(ii) එම වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීමට හේතු පාදකවූ කරුණු කවරේද;

(iii) එම වෙළෙඳ සංකීර්ණයේ වෙළෙඳ කුටි බෙදා දෙනු ලැබූ පදනම කවරේද;

(iv) එම වෙළෙඳ කුටි ලබා ගත් එක් එක් පුද්ගලයාගේ නම, ලබා ගෙන ඇති වෙළෙඳ කුටි සංඛ්‍යාව සහ ප්‍රාදේශීය සභාවට ගෙවනු ලබන මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) වෙළෙඳ කුටි ලබා ගත් පුද්ගලයන් සමඟ එළඹ ඇති ගිවිසුම අනුව එම වෙළෙඳ සංකීර්ණයේ පූර්ණ අයිතිය අදාළ ප්‍රාදේශීය සභාවට අයත් වන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1314/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි වසම් 102 අතරින් ස්ථිර ග්‍රාම නිලධාරි කාර්යාලයක් නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව සහ තාවකාලික ග්‍රාම නිලධාරි කාර්යාල පවත්වාගෙන යනු ලබන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාම නිලධාරි කාර්යාල අතරින් මේ වනවිට අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින, වැසිකිළි පහසුකම් නොමැති, ජල පහසුකම් නොමැති, විදුලි පහසුකම් නොමැති සහ මේ වනවිට විදුලිය විසන්ධි කර ඇති ග්‍රාම නිලධාරි කාර්යාල සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ගැටලු හේතුවෙන් අදාළ ග්‍රාම නිලධාරින්ට නිසි පරිදි සිය සේවා සැපයීමට නොහැකිවී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ඔක්තෝබර් 09 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

18/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව කන්කසන්තුරේ පිහිටා ඇති තෙල් ටැංකි දෙකක් සහ නළ පද්ධතියක් තිබෙන බව දන්නේද;

(ii) එම තෙල් ටැංකි දෙක හා නළ පද්ධතිය භාවිතා කරන ලද රජයේ ආයතනය කවරේද;

(iii) එම තෙල් ටැංකි දෙක හා නළ පද්ධතිය භාවිතා කිරීම වෙනුවෙන් සිමෙන්ති සංස්ථාවට අය විය යුතු මුදල කොපමණද;

(iv) එම මුදල අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1272/2025

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ස්ථාපිත කර ඇති ශික්ෂණ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපනය කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) ශික්ෂණ රෝහලක් ස්ථාපනය කිරීමේ අරමුණු කවරේද;

(iv) එම රෝහලක තිබිය යුතු ප්‍රධාන පහසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සෑම ශික්ෂණ රෝහලකටම වෛද්‍ය පීඨයක් අනුබද්ධ කර තිබේද;

(ii) එම සෑම ශික්ෂණ රෝහලකම මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(iii) මහාචාර්ය ඒකකයක් පිහිටුවා ඇති සහ නොමැති ශික්ෂණ රෝහල් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම රෝහල්වලට අනුබද්ධ කර ඇති වෛද්‍ය පීඨ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) කුලියාපිටිය රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කිරීමේදී, වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය සිසුන්ගේ සායනික පුහුණුව සඳහා මහාචාර්ය ඒකකයක් ස්ථාපිත කිරීමට අදහස් කර තිබුණේද;

(vi) එසේ නම්, එම ඒකකය ඉදිරියේදී ස්ථාපනය කරන්නේද;

(vii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(viii) කුලියාපිටිය ශික්ෂණ රෝහල සඳහා වර්තමාන රජය විසින් ලබාදී ඇති පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1284/2025

ගරු නීතිඥ සරත් කුමාර මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන මැතිවරණ නීතිය අනුව රජයේ සේවකයන්ට පළාත් පාලන මැතිවරණයක අපේක්ෂකයන් ලෙස තරඟ කළ හැකිද;

(ii) ඒ සඳහා දේශපාලන හිමිකම් සහිත රජයේ සේවකයන්ට වැටුප් රහිත නිවාඩු ලබා දෙන බවත්, හිමිකම් නොමැති රජයේ සේවකයන් සේවයෙන් ඉල්ලා අස්විය යුතු බවත් දන්නේද;

(iii) පළාත් පාලන ආයතනයක නගරාධිපති/සභාපති තනතුරට රජයේ සේවකයකු පත්වුවහොත්, එම ධුරය දරන කාල සීමාව තුළදී ඔහුට/ඇයට මැතිවරණයට පෙර කරන ලද රජයේ රැකියාවේ නියුක්ත විය හැකිද;

(iv) ඊට අදාළ නෛතික තත්ත්වය කවරේද;

(v) 2018 පළාත් පාලන මැතිවරණයේදී, මඩුල්ල සහ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් සිය සභාපති ධුර දරන ලද කාල සීමාව තුළදී, සභාපති ධුරයට හිමි වැටුපත්, රජයේ රැකියාවේ වැටුපත් යන දෙකම ලබා ගත් බව දන්නේද;

(vi) ඒ සඳහා ඔවුන්ට නෛතික හිමිකමක් තිබේද;

(vii) ඔවුන් වැටුප් දෙකම ලබා ගෙන තිබේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(viii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1285/2025

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ දුම්රිය මාර්ගයේ නාය යාමේ අවදානම් ස්ථාන හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා ලබාදී ඇති විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1286/2025

ගරු තිලංක යූ. ගමගේ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයේ හා පළාත් සභා රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ නම සහ ශ්‍රේණිගත කර ඇති රෝහල් කාණ්ඩය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බද්දේගම දිස්ත්‍රික් රෝහලේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) එම රෝහලේ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු පද්ධතියක් තිබේද;

(ii) එසේ නම්, එම මධ්‍යස්ථානවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් අවබෝධයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1296/2025

ගරු නිමල් පලිහේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර, පහළ යාං ඔය ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ව්‍යාපෘතියට මුදල් වෙන් කරන ලද මූලාශ්‍රය කවරේද;

(iii) වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ප්‍රදේශ කවරේද;

(v) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබුවේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vii) ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වන පවුල් සංඛ්‍යාව සහ ඔවුන්ට අයත් ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පවුල් පදිංචි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් කවරේද;

(iv) අවතැන්වන පවුල් ඉවත් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(v) අවතැන් වූ එහෙත් මේ වනතෙක් වන්දි ලබා නොදුන් පවුල් සිටින්නේද;

(vi) ඔවුන්ට වන්දි ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1307/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමු තේ දළු නිෂ්පාදනය අඩු වීම තේ කර්මාන්තය ආශ්‍රිත ප්‍රධාන ගැටලුවක් බවත්;

(ii) කාලයක් තිස්සේ තේ වගා කිරීම හේතුවෙන් තේ ඉඩම්වල පස නිසරුවීම සහ පසේ ආම්ලිකතාව වැඩි වීම, මේ සඳහා බලපා ඇති බවත්;

(iii) උණ ශාකය භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන ජෛව අඟුරු (Bio Charcoal) භාවිතා කිරීම මඟින් තේ ඉඩම් දීර්ඝ කාලීනව සශ්‍රීක කළ හැකි බව තේ පර්යේෂණ ආයතනය සහ විශ්වවිද්‍යාල විසින් සනාථ කර ඇති බවත්;

(iv) යොදනු ලබන පොහොර ප්‍රමාණයට සාපේක්ෂව අවශෝෂණය කර ගත හැකි පොහොර ප්‍රමාණයේ වේගවත් වර්ධනයක් ජෛව අඟුරු භාවිතා කිරීම මඟින් සිදු වන බැවින් අනවශ්‍ය ලෙස පොහොර යෙදීම පාලනය කළ හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් තේ කර්මාන්තයට අදාළ ආයතන ඒකාබද්ධ කර ගනිමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1308/2025

ගරු චන්දන සූරියආරච්චි මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවිස්සාවේල්ල නගරයට ආසන්නව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයක් තිබෙන බව දන්නේද;

(ii) එය ඉදිකරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා වියදම් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) එහි සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කෞතුකාගාරය ඉදිකර ඇති ඉඩම රජයට අයත් ඉඩමක්ද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කෞතුකාගාරය සතු කෞතුක භාණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(ii) එම කෞතුක භාණ්ඩ අයත් කාල වකවානු කවරේද;

(iii) මෙම කෞතුකාගාරය ආදායම් උපයන්නේද;

(iv) එසේ නම්, විවෘත කරන ලද දිනයේ සිට මේ දක්වා උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1320/2025

ගරු ඒ. එම්. එම්. එම්. රත්වත්තේ මහත්මිය,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දුරකථන සමාගම් සඳහා මහවැලි-සී කලාපයේ, දෙහිඅත්තකණ්ඩිය කොට්ඨාසය තුළ ඉදිකිරීමට අනුමතිය ලබාදී ඇති දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා රජයේ ඉඩම් බදු පදනම මත ලබාදී තිබේ නම්, එම ඉඩම් ලබා දුන් ක්‍රමවේදය කවරේද;

(iii) පුද්ගලයකු වෙත බැහැර කර ඇති රජයේ ඉඩමක ඉදිකර ඇති දුරකථන කුලුනකට අදාළ ඉඩම් කොටසේ වටිනාකමට හිමිකම් කීමට අදාළ පුද්ගලයාට ක්‍රමවේදයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නවමැදගම කොට්ඨාසයේ කාර්මික කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩමේ කොටසක් බෞද්ධ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා බැහැර කර තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් කොටසේ විශාලත්වය කොපමණද;

(iii) එම බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස ආසන්නයේ ඉදිකරන ලද ඩයලොග් සමාගමේ සන්නිවේදන කුලුනට අදාළ බදු මුදල් නිසි පරිදි අයකර ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1321/2025

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආබාධ සහිත සිසුන් ඉගෙනුම ලබන විශේෂ පාසැල් සංඛ්‍යාව;

(ii) ඒවායේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් සංඛ්‍යාව ආබාධිතභාවය අනුව වෙන් වෙන් වශයෙන්;

(iii) එම විශේෂ පාසැල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව;

(iv) ඒවායේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(v) ශ්‍රී ලංකාවේ ඇති විශේෂ අධ්‍යාපන ඒකක සංඛ්‍යාව;

(vi) ඒවායේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් සංඛ්‍යාව ආබාධිතභාවය අනුව වෙන් වෙන් වශයෙන්;

(vii) එම ඒකකවල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව;

(viii) ඒවායේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශේෂ අධ්‍යාපන ගුරු පත්වීම් ලැබ වෙනත් විෂයයන් උගන්වන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන් විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේම සේවා නියුක්ත කරවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන්නේද;

(iv) ඒවා පවත්වනු ලබන ආයතන කවරේද;

(v) විශේෂ අධ්‍යාපනයට අදාළ පනත් යාවත්කාලීන කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(vi) විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් ගනු ලබන ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්තිමය තීරණ කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ඔක්තෝබර් 10 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

116/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය යහපාලන රජය සමයේ සිදුවූ මහ බැංකු බැඳුම්කර වංචාවක් සම්බන්ධයෙන් සමාජයේ විශාල කතිකාවක් ඇතිවූ බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව මඟින් චෝදනා එල්ල කරන ලද පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම බැඳුම්කර වංචාව හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදුවූ බලපෑම කවරේද;

(iv) එම බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

205/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය සහ එහි මූල්‍යමය වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වෙනත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය පහළ මට්ටමක පැවතීමට හේතු සාධක කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයට කෘෂිකාර්මික අංශයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

228/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණය පිහිටුවන ලද නීතිය කවරේද;

(ii) එම අධිකරණයේ කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම අධිකරණයේ මේ වනවිට විභාග කරනු ලබන නඩු සංඛ්‍යාව සහ එම අධිකරණය මඟින් විභාග කර අවසන් කරන ලද නඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ආරම්භ කරන ලද දිනයේ සිට මේ දක්වා එම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දූෂණ විරෝධී ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම අකර්මන්‍යවී ඇති බව පිළිගන්නේද;

(ii) අල්ලස්, මූල්‍ය අපරාධ සහ මූල්‍ය දූෂණ සම්බන්ධයෙන් වූ නඩු කඩිනමින් විභාගකර අවසන් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

315/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ —

(i) 2024.12.31 දිනට මුළු ණය ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් සහ එක්සත් ජනපද ඩොලර් වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2021 සිට 2024 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයට අදාළ මුළු ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2024.12.31 දිනට මුළු ණය ප්‍රමාණය දේශීය ණය සහ විදේශීය ණය වශයෙන් බෙදී යන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බහුපාර්ශ්වික ණය, ද්විපාර්ශ්වික ණය, ජාත්‍යන්තර ස්වෛරී ණය සහ වාණිජ ණය ලෙස වර්ගීකරණය කළ විට 2024.12.31 දිනට විදේශ ණය සංයුතිය කවරේද;

(v) 2020 සිට 2024 දක්වා කාලය තුළ විදේශ ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) 2024.12.31 දිනට මුළු බහුපාර්ශ්වික ණය ප්‍රමාණය කොපමණද;

(vii) ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව, අයර්ලන්ත මිත්‍ර බැංකුව වෙතින් ලබා ගත් බහුපාර්ශ්වික ණය ප්‍රමාණය 2020 සිට 2024 දක්වා කාලයට අදාළව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 2024.12.31 දිනට මුළු ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය කොපමණද;

(ix) 2020 සිට 2024 දක්වා කාලය තුළ එක් එක් වර්ෂයට අදාළ මුළු ද්විපාර්ශ්වික ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

342/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමන්තුරේ, කල්මුණේ, පොතුවිල්, එරාවූර් සහ මරුදමුනේ යන ප්‍රදේශවල Privelth Global (Pvt.) Ltd. නමින් මූල්‍ය ආයතනයක් 2014.02.05 වනවිට පවත්වාගෙන ගිය බවත්;

(ii) එම මූල්‍ය ආයතනයේ අධ්‍යක්ෂකවරුන් ලෙස කටයුතු කරන ලද අහමඩ් ෂෙරීම් මුහම්මුදු ෂිහාබ් (ෂිහාබ් ෂෙරීම්) සහ ෆාතිමා ෆර්සානා මාකාර් යන අය විසින් පුද්ගලයන් 1400 දෙනෙකුගෙන් රුපියල් කෝටි 170කට අධික මුදලක් වංචා කර ඇති බවත්;

(iii) පසුගිය දෙසැම්බර් මස 26 වන දින ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට හරවා එවා ඇති මෙම පුද්ගලයන් මේ වනවිට අතුරුදහන්ව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(ii)හි සඳහන් අය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) ඔවුන් වංචා කර ඇති මුදල් නැවත අයිතිකරුවන්ට ලබා දීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) මෙවැනි මූල්‍ය ආයතන සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයක් සිදුකර විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

552/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා ඩිජිටල් හැඳුනුම්පතක් හඳුන්වා දෙන්නේද;

(ii) ඩිජිටල් හැඳුනුම්පත භාවිතයේ වාසි කවරේද;

(iii) එම හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(iv) එක් හැඳුනුම්පතක් සකස් කිරීම සඳහා වැය වන මුදල කොපමණද;

(v) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සියලු ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා එම හැඳුනුම්පත සකස් කිරීමට වැය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඩිජිටල් හැඳුනුම්පත හඳුන්වා දීම සඳහා අරමුදල් සපයා ගනු ලබන ආකාරය කවරේද;

(ii) ඒ සඳහා විදේශ ණය හෝ ආධාර ලබා ගන්නේ නම්, එම ණය/ආධාර ලබා දෙන රට හෝ ආයතන කවරේද;

(iii) එම හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලියට මුදල් ආයෝජනය කරන ආයෝජකයන්ට ලබා දෙන ප්‍රතිලාභ කවරේද;

(iv) එම ආයෝජකයන්ට පුද්ගලයන්ගේ දත්ත ලබා ගත නොහැකි බවට සහතික වන්නේද;

(v) ඩිජිටල් හැඳුනුම්පත සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන සියලුම ගිවිසුම් සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

561/2025

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා මී උණ (ලෙප්ටොස්පයිරෝසිස්) රෝගයට ගොදුරු වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ එම රෝගය හේතුවෙන් මරණයට පත්වූ පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මී උණ රෝගය පාලනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

625/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික පාසල්වල සහ පළාත් සභා පාසල්වල මේ වනවිට සේවය කරනු ලබන කම්කරුවන් සංඛ්‍යාව, එම පාසල් සඳහා අනුමත කම්කරුවන් සංඛ්‍යාව සහ එම පාසල්වල මේ වනවිට පවතින කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ජාතික පාසල්වල කම්කරුවන් අතිරික්තයක් පවතින විට පළාත් සහා පාසල්වල කම්කරු පුරප්පාඩු පැවතීමට හේතු කවරේද;

(iii) රජයේ පාසල් පද්ධතිය තුළ කම්කරුවන් නිසි පරිදි ස්ථානගත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

984/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින තේ කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වර්ෂය තුළ තේ කර්මාන්තශාලා 225ක් පමණ වැසී ගොස් ඇති බව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් ප්‍රකාශ කර ඇති බව දන්නේද;

(iii) එම ප්‍රකාශය සත්‍යයක්ද;

(iv) ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු හිමියන්ගේ සහ තේ කර්මාන්තයේ අනාගත සුරක්ෂිතභාවය සහතික කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1120/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා 1999 දී බඳවාගන්නා ලද උපාධිධාරී අභ්‍යාසලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ අභ්‍යාසලාභී පත්වීම් ස්ථිර කරන ලද දිනය කවරේද;

(iii) එම ස්ථිර කිරීම සඳහා උපදෙස්/චක්‍රලේඛය නිකුත් කරන ලද ආයතනය කවරේද;

(iv) එහිදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය කවරේද;

(v) එම උපදෙස් ලිපියේ/චක්‍රලේඛයේ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත උපාධිධාරීන් අතරින් ස්ථිර කරන ලද සංඛ්‍යාව, එක් එක් රේඛීය අමාත්‍යාංශය, පළාත් සභා අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව සහ ආයතනය අනුව සහ එක් එක් තනතුරු කාණ්ඩ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් තනතුරු කාණ්ඩ සඳහා අදාළ ආරම්භක වැටුප, වැටුප් පරිමාණය සහ වැටුප් කේත අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ස්ථිර කිරීමෙන් පසුව ඉහත උපාධිධාරීන් සඳහා සේවා ව්‍යවස්ථා/ බඳවාගැනීමේ පටිපාටි සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒවා සකස් කරන ලද වර්ෂය කවරේද;

(v) ඒවායේ පිටපත් ඉදිරිපත් කරන්නේද;

(vi) සේවා ව්‍යවස්ථා/බඳවාගැනීමේ පටිපාටි සකස් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(vii) සේවා ව්‍යවස්ථා අනුව උසස් කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ චර්යාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ චර්යාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් තරඟ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/2025

ගරු රවී කරුණානායක මහතා,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කළ යුතු බවටත් ශ්‍රී ලංකාවේ දැනට උද්ගතව තිබෙන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාර්ගික හෝ ආගමික පදනමක් දක්වන නම් දරන දැනට පවතින දේශපාලන පක්ෂ වලටද එවැනි වෙනසක් ක්‍රියාත්මක කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/2025

ගරු රවී කරුණානායක මහතා,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන ගැටළු විසඳීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන පහරදීම, පැහැර ගැනීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අපයෝජනය, මනුෂ්‍ය ඝාතනය හා මූල්‍ය වංචා ඇතුළු ගැටළු පිළිබඳව සොයා බැලීමට සහ බලපෑමට ලක් වූ සේවකයින්හට ශ්‍රී ලංකාවට ආරක්ෂිතව නැවත පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමට නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇති ජනතා අප්‍රසාදය වළක්වා ගැනීමට කටයුතු කිරීම,— ජනතාවට වඩාත්ම සමීපතම මහජන නියෝජිත ආයතනවන බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් බොහෝවිට ජනතාව තුළ ඉතාමත් අසතුටුදායක හැඟීමක් පවතින හෙයින් එම ආයතන පිළිබඳ වැඩි අවධානයක් ලබා දීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/2025

ගරු ටී. කේ. ජයසුන්දර මහතා,— පිටිගල, උඩුගම, නෙලුව සහ දෙණියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— ශ්‍රී ලංකාව නව පුනරුදයකට අවතීර්ණ වී ඇති අවස්ථාවක රටේ සංචාරක ව්‍යාපාරය දේශීය ආදායම ඉහළ නැංවීමට හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පහතරට වැසි වනාන්තර අතරින් ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයද, විශේෂිත සත්ත්ව හා ශාක විශේෂවලින් ගහන වූ කන්නෙලිය වනාන්තරය සහ හිනිදූම කන්ද ඇතුළත් කඳුවැටියේ (හේකොක්) ජෛව පද්ධතිය විදේශීය ජනතාවගේ විශේෂ අවධානය දිනාගත් පරිසර පද්ධතියක් වන හෙයින්ද, මෙම පරිසර පද්ධතිය ඇතුළත් පිටිගල, උඩුගම, නෙලුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කර එය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/2025

ගරු රුවන් මාපලගම මහතා,— පාසැල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්ම ඇතුළත් කිරීම,— මෙරට පොදු ජනතාව මුහුණ දෙන එදිනෙදා ගැටලුවලට ප්‍රධාන හේතුවක් ලෙස එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික නීතිය පිළිබඳ නොදැනුවත්කම හඳුනාගෙන ඇති හෙයින් ද, නීතිය නොදැන සිටීම නීතිය ඉදිරියේදී නිදහසට කරුණක් නොවන හෙයින්ද, පාසැල් විෂය මාලාව සංකීර්ණ වීම වළක්වා ගනිමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසැල් දරුවන්ගේ පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශයට රටේ මූලික නීතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මහාචාර්ය, ආචාර්ය තනතුරු අවභාවිත කිරීම වළක්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ අප සමාජයේ බොහෝ පිරිස් මහාචාර්ය, ආචාර්ය වැනි තනතුරු හා නාමයන් අවභාවිත කරන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වැඩසටහනක් සකස් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය පිහිටුවා මේ වන විට වසර 35ක් පමණ ගතවී ඇති හෙයින්ද, එම පරීක්ෂණාගාරය මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින්ද, එබැවින් ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරීක්ෂාවකට ලක් නොවන හෙයින්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා නිසි වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/2025

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම,— රටක ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම රජයක වගකීම වන හෙයින්, මෙරට ජනයාගෙන් බහුතරයක් වන ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 48/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීම,— විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළ යුතු වුවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වසර 21කට වැඩි කාලයක සිට ඛනිජ තෙල් සහ ජලය යන කර්මාන්ත නියාමනයට යටත් නොවී තිබෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා අදාල නීතිමය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය වැළැක්වීමට ක්‍රමවේදයක් සකස් කිරීම,— විශේෂයෙන්ම ඌව පළාත ඇතුළුව කඳුකර ප්‍රදේශවල වගා කර ඇති ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය පිළිබඳව සලකා බලා ඒවා ඉවත් කර ප්‍රයෝජනවත් දේශීය වගාවන් සිදු කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් ණය වින්දිතයින් බවට පත් වූ පුද්ගලයින්හට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පිරිසෙන් අති බහුතරයක් මේ වනවිට ණය වින්දිතයින් බවට පත්ව සිටින බැවින්, එම පිරිසට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— පළාත් පාලන ආයතන තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා කළ තැනැත්තන්ට එරෙහිව පියවර ගැනීම,— ශ්‍රී ලංකාව පුරා පිහිටි සියලුම පළාත් පාලන ආයතනයන්හි පසුගිය කාලය තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා වීම සම්බන්ධව කඩිනමින් පරීක්ෂණ පවත්වා ඒ සඳහා දායක වූ සියලුම බලධාරීන්ට පවත්නා නීතිය අනුව දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 55/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික ස්ථානයක් වන මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන බොහෝ ප්‍රමාණයක් පවතින හෙයින් ද, එම ස්ථාන සංචාරක ආකර්ශණයට ලක් වී ඇති හෙයින් ද, වර්තමානය වනවිට එවැනි ස්ථාන දැඩි අනාරක්ෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් ද, මෙම ස්ථානවල මුල් පෞරාණිකභාවයට හානියක් නොවන ලෙස සංරක්ෂණය කොට එම ස්ථාන සතු ඉඩම් කඩිනමින් මැන නිරවුල් කොට අනාගත පරපුර සඳහා ආරක්ෂා කර දෙමින් සංචාරක කර්මාන්තයට යොදා ගැනීම සඳහා ඒවා ආරක්ෂා කිරීමට වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පන හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ශණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා "බයිතුල්මාල්" නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු (Student Counsellor) පත් කිරීම,— වර්තමානයේ බොහෝ පාසල් සිසුන් අතර විවිධ මානසික පසුබෑම් දක්නට ලැබෙන හෙයින් ද, මෙම තත්ත්වයන් ඔවුන්ගේ ශාරීරික හා සමාජීය පැවැත්ම සඳහා චක්‍රාකාරව බලපාන හෙයින් ද, ඇතැම් අවස්ථාවලදී පාසල් සඳහා පාසල් මනෝ උපදේශකවරයන් පත් කර තිබුණ ද එම තනතුර සඳහා පාසල් ගුරුවරුන්ගේ භූමිකාවද ඇතුළත්වීම හරහා ඉන් බලාපොරොත්තු වන සේවය ඵලදායීව සිදු වී නොමැති හෙයින් ද, සෑම පාසලකටම මනෝ උපදේශකයකවරයෙකුගේ අවශ්‍යතාවය මතු වී ඇති හෙයින් ද, පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය හා පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු පත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වන "රටවිරුවන්" වෙනුවෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය පණ ගැන්වීම සඳහා විදෙස්ගත ශ්‍රමික ප්‍රජාවගෙන් ලැබෙන දායකත්වය ඉතා සුවිශේෂ වන හෙයින් ද, ආර්ථික අර්බුදය හමුවේ විදෙස් රටවල වසර ගණනාවක් රැකියා කිරීමෙන් අනතුරුව නැවත ශ්‍රී ලංකාවට පැමිණ තම දූ දරුවන්ද සමඟින් ජීවිකාව ගෙන යන ඔවුන්ට ඇතැම් අවස්ථාවලදී නැවත රැකියාවක් කිරීමට තරම් හැකියාවක් නොමැතිවීම හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදුවන හෙයින් ද, ඔවුන්ගෙන් විදේශ විනිමය වශයෙන් ලැබෙන මුදලින් යම් ප්‍රතිශතයක් යොදාගෙන විශ්‍රාම අරමුදලක් පිහිටුවා විශ්‍රාම යෝජනා ක්‍රමයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 60/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— තරුණ දරුවන් විසින් සිය දිවි හානි කර ගැනීම වළක්වා ගැනීම,— පසුගිය කාලය තුළ සෑම පාසලකම උපදේශනය සඳහා ගුරුවරුන් පුහුණු කිරීම, සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම උපදේශන අංශයක් පිහිටුවීම, සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම උපදේශන ඒකකයක් පිහිටුවීම, රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාලවල උපදේශන ඩිප්ලෝමා පාඨමාලා, උපාධි පාඨමාලා, පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීම, මානසික අවපීඩන තත්ත්වයන්ට විසඳුම් සෙවීම සඳහා සෑම ප්‍රධාන රෝහලකම මානසික වෛද්‍ය ඒකක පිහිටුවීම ආදිය මඟින් තරුණ දරුවන් සිය දිවි හානි කර ගැනීම වළක්වා ගැනීමට ගත් ක්‍රියාමාර්ග අසාර්ථක වී ඇති හෙයින් දේශපාලන අධිකාරිය, රජයේ නිලධාරින්, විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය සහ මහජනතාව එකී ක්‍රියාමාර්ග කෙරෙහි ගැඹුරින් මැදිහත් විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 61/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ පිහිටි ආපනශාලාවන්හි ළමුන්ට අහිතකර ආහාර අලෙවි කිරීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් අතර දියවැඩියාව රෝගය බහුල වශයෙන් හඳුනාගෙන ඇති බව විශේෂඥ වෛද්‍යවරුන් පෙන්වා දී තිබෙන හෙයින්ද, දියවැඩියාව රෝගය සඳහා ආහාර වර්ග මෙන්ම ආහාර පුරුදු සහ ආහාර රටාව හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුල පිහිටි පාසල් ආපනශාලාවන්හි දියවැඩියාව සඳහා හේතු වන්නා වූ සීනි සහ පිටි සහිත ආහාර මෙන්ම ෆ්‍රයිඩ් රයිස්, කොත්තු, ක්ෂණික නූඩ්ල්ස් වැනි ආහාර වර්ග ඉතා විශාල වශයෙන් පාසල් ළමුන්ට අලෙවි කරන හෙයින්ද, අප රටේ පාසල් දරුවන් අතර දියවැඩියා රෝගී තත්ත්වය පාලනය කිරීම සඳහා පාසල් ආපනශාලාවල අලෙවි කළ යුතු ආහාරපාන වර්ග පිළිබඳව රජය විසින් යම් සීමාවන් පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 62/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය සේවය ආරම්භ කිරීමේ මුඛ්‍ය පරමාර්ථය වූයේ භාණ්ඩ ප්‍රවාහනය හෙයින්ද, මේ වනවිට දුම්රිය සේවය එයින් බැහැර වී ඇති හෙයින්ද, දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය වියදම් අඩු ක්‍රමයක් වන හෙයින්ද, එහි ප්‍රතිලාභ රටේ ජනතාවට සෘජුවම අත්වන හෙයින්ද, හැකි සෑම අවස්ථාවකදීම දුම්රිය මඟින් භාණ්ඩ ප්‍රවාහනය මෙන්ම ඉන්ධන ප්‍රවාහනය සඳහා රජය විසින් නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 63/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— සිය කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමේදී ගොවීන්ට සිදුවන අසාධාරණය අවම කිරීම,— සිය කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී තොග වෙළඳුන් මෙන්ම සිල්ලර වෙළඳුන් විසින් ද ඉතා අඩු මුදලක් නියම කිරීම හේතුවෙන් මෙරට ගොවීන් බරපතල අසාධාරණයකට ලක්වන හෙයින්ද, එකී භාණ්ඩ වෙළඳුන්ගෙන් මිලදී ගැනීමේදී පාරිභෝගික ජනතාවට වැඩි මිලක් ගෙවීමට සිදුව ඇති හෙයින්ද, ගොවියාත්, පාරිභෝගිකයාත් එකවර අසාධාරණයන්ට ලක් කරන්නා වූ මෙකී ක්‍රියාදාමයන් වෙනස් කරමින්, ගොවියාට සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉටු කර දීම වෙනුවෙන් රජය විසින් කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 64/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— පෙර පාසල් අධ්‍යාපනය නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සියලුම අධ්‍යාපන අවස්ථා අතරින් පෙර පාසල් අධ්‍යාපනය අතිශය වැදගත් සහ තීරණාත්මක වන හෙයින්, ශ්‍රී ලංකාවේ පෙර පාසල් අධ්‍යාපනය එක් ආයතනයකින් නියාමනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 65/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— අපනයන නිෂ්පාදකයින්ට පහසුකම් සැපයීම,— අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සහ වෙනත් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට අපනයන වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම්, දැනුම සහ ප්‍රවේශ මාර්ග නොමැති හෙයින්, විදේශ විනිමය උත්පාදනයේ ප්‍රධාන සංරචකයන් වන අපනයන ක්ෂේත්‍රයේ නියැළි තරුණ ව්‍යවසායකයින්ට ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 66/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— උසස් පෙළ විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ට සාහිත්‍යය විෂය හඳුන්වා දීම,— ශ්‍රී ලංකාවේ පාසල්වල විද්‍යා, වාණිජ සහ තාක්ෂණවේදය විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ හදාරන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදය ඉහළ නැංවීම සඳහා එම විෂය ධාරාවන් සඳහා අමතර විෂයයක් ලෙස සාහිත්‍යය විෂය හඳුන්වා දියයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 67/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— රෝහල්වල නේවාසික රෝගීන්ට උපස්ථානය සැලසීම,— රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකු අසල, රෝගියාගේ ආරක්ෂාව සඳහා දිවා හා රාත්‍රී කාලයන්හි භාරකරුවෙකු නතර කළ යුතු බවට වාට්ටු භාර හෙද නිලධාරින් විසින් දැනුම් දෙනු ලබන හෙයින්ද, එලෙස භාරකරුවෙකු නොමැති අවස්ථාවකදී පෞද්ගලික උපස්ථාන සේවකයින් ගාස්තු ගෙවා ලබා ගත යුතුව ඇති හෙයින්ද, එකී උපස්ථාන සේවකයින් දිනකට රු. 3500 ක පමණ මුදලක් අය කරන හෙයින්ද, දින කිහිපයක් රෝහල් ගතව සිටීමට සිදු වුවහොත් එය දරා ගැනීමට අපහසු මුදලක් වන හෙයින්ද, රෝහලක නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගියෙකුගේ ආරක්ෂාව සහ උපස්ථානය, රෝහලේ සේවය කරනු ලබන උපස්ථායකවරුන් විසින් ලබා දීමේ ක්‍රමවේදයක් රජය විසින් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 68/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— ඉඩම් සඳහා බලපත්‍රලාභී ඔප්පු හිමියන්ට ස්ථිර ඔප්පු ලබා දීම,— රටේ ජනතාවගෙන් සැලකිය යුතු පිරිසකට ස්වකීය ඉඩම සඳහා හිමිව ඇත්තේ බලපත්‍ර හෝ ස්වර්ණ භූමි වැනි ඔප්පු වන හෙයින්, ඔවුන් සඳහා ඔප්පු ලබා දීමේ නිවැරදි ක්‍රමවේදයක් සැකසිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/2025

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා,— ශ්‍රී ලංකාවේ ඉහළ අධිකරණවල විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස ඉහළ නැංවීම,— විදේශීය අධිකරණ බලපද්ධතින්වල සිටින බොහෝ උසස් අධිකරණ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගත යුතු වයස හා සැසඳීමේදී, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගැන්වීමේ වයස ඊට වඩා අඩු අගයක් ගන්නා හෙයින්, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 67ක් ලෙසත්, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65ක් ලෙසත්, මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 63ක් ලෙසත්, විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාවන් ඉහළ දැමීම පිණිස අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 70/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම හා ආර්ථිකය සංවර්ධනය කිරීම, — ශ්‍රී ලංකාවේ යාපනය ප්‍රදේශයේ සංචාරක සේවා ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථිකය සංවර්ධනය කිරීම මඟින් මෙරට සංචාරක ආර්ථිකය ශක්තිමත් කිරීමටත්, රැකියා නිර්මාණය කිරීමටත්, යාපනය සජීවී සංස්කෘතික ගමනාන්තයක් ලෙස පිළිබිඹු කිරීමටත් හැකි වන බැවින්, යාපනය සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය ප්‍රධාන සංචාරක කේන්ද්‍ර ලෙස පිළිගැනීමට සහ දේශීය හා විදේශීය සංචාරකයින් ප්‍රදේශයේ හෝටල්, අවන්හල් සහ සේවා සපයන්නන් සමඟ සම්බන්ධ කිරීම, සැබෑ සංචාරක අත්දැකීම් ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයට සංචාරකයින් පැමිණීම සහ ඔවුන්ගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම්, ඩිජිටල් සම්බන්ධතාවය සහ අළෙවිකරණය වැඩි දියුණු කරන ප්‍රතිපත්ති සහ

ආයෝජන සඳහා සහාය වන, ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ නියුතු වූවන් සවිබල ගන්වන සහ සංස්කෘතික උරුමය ප්‍රවර්ධනය කරන සංචාරක සේවා ව්‍යාපාර දිරිමත් කිරීම සහ ඒවාට පහසුකම් සැලසීම මඟින් යාපනය ප්‍රදේශයේ සංචාරක කර්මාන්තයේ තිරසාර සංවර්ධනය සහ ආර්ථික වර්ධනය වැඩිදියුණු කරන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීම මඟින් සහ මාස 12 සිට 18 දක්වා වූ කාලයක් තුළ තිරසාර ආර්ථික ප්‍රතිලාභ ඉලක්ක කර ගනිමින් ප්‍රදේශයේ රැකියා සහ ව්‍යාපාරික අවස්ථා කෙරෙහි එවැනි වැඩසටහන් මඟින් ඇති කරන බලපෑම නිරීක්ෂණය කිරීම මඟින් යාපනය කේන්ද්‍ර කරගත් සංචාරක වේදිකාවක් නිර්මාණය කිරීම සඳහා සහාය දීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— යාපනය හා උතුරු පළාත තුළ තරුණයන් සඳහා තිරසාර රැකියා අවස්ථා නිර්මාණය කිරීම පිණිස ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම,— ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම මඟින් රජයට ආර්ථික වර්ධනය උත්තේජනය කොට දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගනිමින් තරුණයින් සඳහා තිරසාර රැකියා අවස්ථා ජනනය කළ හැකි හෙයින් ද, එවැනි කලාප සංවර්ධනය කිරීමෙන් රජයට කාර්මික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, කුසලතා සංවර්ධනය වැඩි දියුණු කිරීම හා ව්‍යවසායකත්වය දිරිමත් කිරීම තුළින් විරැකියාවට විසඳුම් ලබාදිය හැකි හෙයින් ද, යාපනයේ උතුරු පළාතේ සහ සමස්තයක් වශයෙන් රටේ දිගුකාලීන සමාජ-ආර්ථික ප්‍රගතියක් ඇති කිරීමට රට පුරා අනෙකුත් උපායමාර්ගික ස්ථාන වලට සමගාමීව යාපනයේ සහ උතුරු පළාතේ ද ස්ථිර විශේෂ ආර්ථික කලාපයක් (SEZ) ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/2025

ගරු කන්දසාමි ප්‍රභු මහතා,— කිරි නිෂ්පාදන අංශයෙන් ස්වයංපෝෂිතත්වය ප්‍රවර්ධනය කිරීම,— වර්තමානයේ මෙරට සැලකිය යුතු විදේශ විනිමය අහිමි වීමකට මගපාදමින් ආනයනික කිරි නිෂ්පාදන මත යැපෙන හෙයින්ද, උසස් ගව වර්ග, පශු වෛද්‍ය උපස්ථානය, සත්ව ආහාර හා යටිතල පහසුකම් සඳහා සීමිත ප්‍රවේශයක් තිබීම වැනි ගැටළුවලට ගොවීන් මුහුණපාන හෙයින්ද, මෙම අභියෝග ආමන්ත්‍රණය කිරීම මඟින් ආහාර සුරක්ෂිතතාව වර්ධනය කොට, ග්‍රාමීය රැකියා ජනනය කරමින්, ආනයන මත යැපීම අඩු කර ගත හැකි හෙයින්ද, අභිජනනය සහ පශු වෛද්‍ය සේවා වෙත ප්‍රවිශ්ටය දියුණු කිරීමෙන්, සත්ව ආහාර වගාව ව්‍යාප්ත කිරීමෙන්, ගොවි පුහුණුව හා යටිතල පහසුකම් ශක්තිමත් කිරීමෙන්, කිරි ගොවීන්ට දිරිගැන්වීම් ලබා දීමෙන්, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කිරීමෙන් සහ කිරිපට්ටි සංවර්ධනය පිළිබඳ පර්යේෂණ දිරිගැන්වීමෙන්, කිරිවලින් ස්වයංපෝෂිතභාවය සාක්ෂාත් කර ගනු පිණිස රජය විසින් ජාතික කිරිපට්ටි සංවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවටද, අදාළ අමාත්‍යාංශ විසින් පළාත් සභා හා ගොවි කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය වීම සඳහා යාන්ත්‍රණයක් ඇති කරනු ලැබිය යුතු බවටද, අදාළ පාර්ලිමේන්තු කාරක සභාව විසින් වැඩිදුර ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ නිර්දේශ කිරීම නිරීක්ෂණය කරනු ලැබිය යුතු බවටද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 73/2025

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සම්පන්නභාවය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දීම,— ජනගහනයෙන් බහුතරයක් විවෘත හදවත් සැත්කම්වලට භාජනය වන හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය සඳහා වඩා හොඳ අවස්ථා ලබා දිය යුතු බවටත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල හරහාද, රජයේ සේවකයින්ට සහ රැකියා නියුක්තිකයන් නොවන අයට රජය විසින් ජනාධිපති අරමුදල හරහාද පූර්ණ පිරිවැය සහිතව නොමිලේ පහසුකම් සලසා දිය යුතු බවටත් මෙම සභාව යෝජනා කර සිටී.

පා. 74/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— සතියේ වැඩ කරන දිනවල ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන කාලයේදී සහ සවස් කාලයේදී බස් ප්‍රමුඛතා මංතීරු කඩිනමින් ඇති කිරීම,— ප්‍රධාන නගර ආශ්‍රිතව උදෑසන හා සවස් කාලයේදී පවතින දැඩි මාර්ග තදබදයට පිළියමක් ලෙස උදෑසන සහ සවස් කාලයන්හිදී බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමයක් ක්‍රියාවට නැංවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 75/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම යාවත්කාලීන කිරීම,— ඉතාලි-ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික රියදුරු බලපත්‍ර ගිවිසුම මඟින් ශ්‍රී ලාංකිකයන්ට විශාල ප්‍රතිලාභ හිමිවන හෙයින්, එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 76/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— සුහුරු විදුලිබල පද්ධතියක් සහ සුහුරු මීටර් හඳුන්වා දීම,— පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයක් ලෙස සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය ඉතා වැදගත් වුවත්, විශේෂයෙන්ම වහල මත සවිකරන ලද සූර්ය පැනල මඟින් ජනනය වන විදුලි ප්‍රමාණය, පද්ධති පාලන මධ්‍යස්ථානයේදී වෙන්කර හඳුනාගත නොහැකි හෙයින්, ජාතික විදුලිබල පද්ධතිය (Grid) සුහුරු තත්ත්වයට (Smart Grid) පත්කිරීමටත්, සුහුරු මීටර් (Smart Meters) හඳුන්වා දීමටත් කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 77/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ආහාර රස ගැන්වීමට යොදන අහිතකර කෘත්‍රිම රසකාරක තහනම් කිරීම,— රයිස්, කොත්තු හා නූඩ්ල්ස් වැනි ආහාර රස ගැන්වීමට මෙරට ආපනශාලා සහ හෝටල්වලදී යොදන කෘත්‍රිම රසකාරක, නොයෙක් බෝ නොවන රෝගවලට හේතු වන බව වාර්තාවන හෙයින්, ඒ පිළිබඳව පිළිගත් ආයතනයක් මඟින් නිසි අධ්‍යයනයක් සිදුකර, එම අහිතකර රසකාරක තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 78/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම,— මඩකලපුව සිට පොතුවිල් දක්වා දුම්රිය මාර්ගය සහ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීම මඟින් මඩකලපුව, අම්පාර හා මොනරාගල යන දිස්ත්‍රික්කවල විශාල ජනතාවකට ප්‍රතිලාභ ලැබෙන හෙයින්, මඩකලපුව සිට පොතුවිල් දක්වා හෝ මාතර සිට කල්මුණේ දක්වා දුම්රිය මාර්ගය පුළුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 79/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— ජපන් ජබර ශාකයේ ව්‍යාප්තිය හිතකර ලෙස පාලනය හා මර්දනය කිරීම,— ජපන් ජබර නොහොත් Eichhornia crassipes (Mart.) Solms යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ආක්‍රමණශීලී ශාකය, වර්තමානයේ ගොවි බිම් සහ වගුරු බිම් වසා පැතිරී ගොස් ඇති හෙයින් ද, මෙහි ශීඝ්‍ර වර්ධන වේගය හේතුවෙන් දේශීය ශාක අභිබවා ජෛව පරිසර පද්ධතියට තර්ජනයක් වී ඇති හෙයින් ද, මෙම තත්ත්වය හේතුවෙන් රොන් මඩ තැන්පත් වී ජල ප්‍රවාහන මාර්ග සහ ජල බැස්ම අවහිර වීම මඟින් ජල ගැලීම් හා ගංවතුර තත්ත්ව ඇති වී ඇති හෙයින් ද, එදිනෙදා භාවිතයට අවශ්‍ය වන ජලයේ තත්ත්වයට හානිවීම සහ ජල විදුලි උත්පාදනයේදී බාධා ඇති වී ඇති හෙයින් ද, රසායනික වල් නාශක භාවිතය මඟින් ඒවා මර්දනය එම ජලය පරිහරණය කරන පුද්ගලයින්ට සෞඛ්‍ය අවදානමක් ඇති කරන හෙයින් ද, මදුරු කීටයන් බෝවීම හා එමඟින් බරවා හා ඩෙංගු වැනි රෝග ව්‍යාප්තවීම සිදු වී ඇති හෙයින් ද, මෙම ශාකය හිතකර ලෙස පාලනය හා මර්දනය මඟින් තිරසර විසඳුමක් උදෙසා රජය විසින් අදාළ ව්‍යාපෘති යෝජනා සැකසීම කාලෝචිත බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 80/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් මුස්ලිම් ජනතාවගේ මෘතදේහ ආදාහනය කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීම,— කොරෝනා වසංගතය පැවති කාලය තුළ, ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශයන්ට පටහැනිව ඒකපාර්ශ්විකව හා බලහත්කාරයෙන් ආදාහනය කරන ලද මුස්ලිම් ජනතාවගේ මෘතදේහ සංඛ්‍යාව, එලෙස ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන් යනාදී තොරතුරු විමර්ශනය කිරීම සඳහාත්, මෙසේ මෘතදේහ බලහත්කාරයෙන් ආදාහනය කිරීමට හේතු වූ පසුබිම මෙන්ම බලහත්කාරයෙන් ආදාහනය කරන ලද පුද්ගලයින්ගේ ඥාතීන්ගේ මානසික තත්ත්වය පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, මෙයට අනුබල දෙමින් මාර්ගෝපදේශයන්ට පටහැනිව කටයුතු කළ දේශපාලනඥයන් ඇතුළු රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව විමර්ශනය කිරීම සඳහාත්, කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— රසායන ද්‍රව්‍ය යොදා පලතුරු ඉදවීම නතර කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පලතුරු වෙළඳපොළ තුළ ස්වාභාවිකව පැසී ඉදුණු පලතුරු වෙනුවට, නොපැසුණු පලතුරු රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, ආනයනික පලතුරු ද රසායන ද්‍රව්‍ය යොදා කෘත්‍රිමව ඉදීමට සලස්වා අලෙවි කරනු ලබන හෙයින් ද, මෙම පලතුරු වැඩි

වශයෙන් දරුවන් විසින් ආහාරයට ගනු ලබන හෙයින් ද, කූට ව්‍යාපාරිකයින් රටේ අනාගතය විනාශ කරමින් ලාභ ලැබීමේ පරමාර්ථයෙන් සිදු කරන මෙම ක්‍රියාව නතර කිරීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— ආයතන ප්‍රධානීන් පත්කිරීමේ නිර්ණායකයක් ලෙස ප්‍රධාන කාර්ය සාධන දර්ශකය යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීමේ දී ජ්‍යෙෂ්ඨත්වය සේම ඔවුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPl - Key Performance Indicator) නිර්ණායකයක් ලෙස යොදා ගැනීම සඳහා ක්‍රමවේදයක් රාජ්‍ය සේවයට ඇතුළත් කොට, ඒ අනුව ආයතන ප්‍රධානීන් පත්කිරීමට නිර්දේශ ලබා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ අමාත්‍යවරුන් හට තනතුරු ලබා දීමේ දී ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සලකා බැලීම, — පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ අමාත්‍යවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI - Key Performance Indicator) වාර්ෂිකව පරීක්ෂා කර, ඔවුන්ට තනතුරු ලබා දීමේ දී එකී දර්ශකය සලකා බලා, තනතුරු ලබාදීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන් වෙනත් තනතුරුවලට පත්කිරීමේ දී ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම, — අග්‍ර විනිශ්චයකාරවරයාගේ සිට අධිකරණ ක්ෂේත්‍රයේ පහළ නිලයන් දක්වා තනතුරු දැරූ තැනැත්තන්, ඔවුන්ගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, එකී තනතුරු දැරීම නතර වූ තැන් සිට අවම වශයෙන් වසර තුනක කාලයක් රාජ්‍ය සේවයේ, සංස්ථාපිත මණ්ඩල, කොමිෂන් සභා, විනිශ්චය මණ්ඩලවල හෝ විදේශ සේවයේ (තානාපති වැනි) තනතුරුවලට පත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නතර කිරීම,— දේශපාලන පක්ෂ විසින් තම පක්ෂයෙන් තේරී පත් වූ මහජන නියෝජිතයින්ගේ මාසික වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය එම පක්ෂවලට ලබා ගැනීම මහජන නියෝජිතයින්ගේ ස්වාධීනත්වය අහෝසි වන ක්‍රියාවක් වන හෙයින් ද, එය ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල අභියෝගයක් වන හෙයින් ද, මෙලෙස දේශපාලන පක්ෂ විසින් මහජන නියෝජිතයින්ගේ වැටුප්, දීමනා සහ වාහන බලපත්‍ර ආදිය තම පක්ෂවල අරමුදල් සඳහා බැර කර ගැනීම නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 87/2025

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— සෑම දිස්ත්‍රික්කයකම මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— මේ වන විට හෙරොයින් වැනි මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන හෙයින් ද, ඒ සඳහා ඇබ්බැහිවූවන් ප්‍රදේශයකට සීමා නොවී රට පුරා ව්‍යාප්තව සිටීම සහ ඔවුන්ගෙන් ප්‍රචාරණය වීම මෙයට හේතු වී තිබෙන හෙයින් ද, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ මධ්‍යස්ථාන රට පුරා ස්ථාන කිහිපයක පමණක් පැවතීම මත් ද්‍රව්‍ය භාවිතා කරන්නන්ගේ වර්ධනය පාලනය කිරීමට දැඩි ගැටලුවක්ව ඇති හෙයින් ද, එයට විසඳුමක් ලෙස සියලු පහසුකම් සහිතව අවම වශයෙන් දිස්ත්‍රික්කයකට එක් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ වන සතුන් කළමනාකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් ජෛව විවිධත්වයෙන් ඉහළ රටක් ලෙස සැලකෙන හෙයින් ද, වනාන්තර විනාශය, මිනිසුන්ගේ ආක්‍රමණය හේතුවෙන්, නීති විරෝධී වන සතුන් වෙළඳාම, මිනිසා සහ වන සතුන් අතර ගැටුම් වර්ධනය වීම නිසා වාර්ෂිකව මෙම සතුන් මෙන්ම මිනිස් ජීවිත ද විශාල වශයෙන් අහිමි වන හෙයින් ද, නව ප්‍රතිපත්ති සහ සැලසුම් මඟින් ජාතික වන සතුන් කළමනාකරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම තිරසර සංවර්ධන අරමුණක් වන හෙයින් ද, එමඟින් සතුන්ගේ වාසස්ථාන ආරක්ෂා වීම, මිනිසා සහ වන සතුන් අතර ගැටුම් අවම වීම, ගොවි ජනතාවගේ ආර්ථික මට්ටම සහ සමාජ ජීවිතය උසස් වීම සිදුවන හෙයින් ද, ඒ සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රායෝගික හා නවීන ප්‍රතිපත්තියක් සහ ක්‍රමවේදයක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වඩාත් ඵලදායී ලෙස භාවිතා කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය රටේ ආර්ථිකයේ මූලික අංශයක් වන හෙයින් ද, වාර්ෂිකව නිෂ්පාදන ක්‍රියාවලියට යොදවනුයේ කෘෂිකාර්මික ඉඩම්වලින් 40%කට ආසන්න ප්‍රමාණයක් පමණක් වන හෙයින් ද, ඉතිරි ඉඩම් නිසි ලෙස සැලසුම් නොකිරීම, ජල සම්පත් හිඟය, තාක්ෂණික දැනුම නොමැති වීම සහ නව්‍යකරණය නොවීම හේතුවෙන් භාවිතා නොවන හෙයින් ද, නිෂ්පාදන මට්ටම අඩු වීම මඟින් ආහාර ආනයනය සඳහා වසරකට විශාල මුදලක් වැය වන හෙයින් ද, කෘෂිකාර්මික නිෂ්පාදනයේ වර්ධනය ඉදිරි වසර කිහිපය තුළ 30%කින් වැඩි කිරීමටත්, ඉන් ගොවීන්ගේ ආදායම වැඩි කිරීමටත්, වාණිජ කෘෂිකර්මයේ ව්‍යාප්තිය වැඩි කිරීමටත්, සියලුම කෘෂිකාර්මික භූමි ගවේශණය කර, භූමියෙහි වර්ගය, බෝගවලට යෝග්‍ය බව, ජලය සහ ගොවිතැන පිළිබඳ තොරතුරු ඇතුළත් මූලික දත්ත පද්ධතියක් සකස් කිරීම මඟින් රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීමටත්, ගොවීන්ගේ ජීවන මට්ටම උසස් කිරීමටත්, ඉඩම් වඩාත් ඵලදායි ලෙස භාවිතා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— යාපනය දිස්ත්‍රික්කයේ අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන් සඳහා මුහුදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම,— යාපනය දිස්ත්‍රික්කයේ විශේෂයෙන් නෙඩුන්තීව්, නයිනතීව්, එලුවයිතීව් සහ අනලයිතීව් වැනි අක්වෙරළ දූපත්වල පදිංචිකරුවන්ට දශක ගණනාවක් තිස්සේ ප්‍රමාණවත් මුහුදු ප්‍රවාහන පහසුකම් අහිමි වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන්ට මුහුදු මාර්ගයෙන් පැය කිහිපයක් ගමන් කිරීමට සිදු වන හෙයින් ද, රෝගීන්, ගර්භනී කාන්තාවන්, වැඩිහිටියන්, පාසල් කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය නොවන සංවිධානවල සේවකයින් මෙම ගමන් වලදී දැඩි දුෂ්කරතා සහ අවදානම්වලට මුහුණ දෙන හෙයින් ද, "ගම් සංවර්ධනය ජාතියේ සංවර්ධනය" බව පිළිගෙන ඇති හෙයින් ද, එම දූපත්වල පදිංචිකරුවන්ට නවීන, ආරක්ෂිත, වේගවත් සහ විශ්වාසදායක මුහුදු ප්‍රවාහන පහසුකම් සැපයීමට රජය වහාම පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම,— තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවය ආරම්භ කිරීම මගින් විශේෂයෙන්ම ඉන්දියාවේ සිට මෙරටට සංචාරකයින් පැමිණීම වැඩි කරනු ලැබිය හැකි හෙයින් ද, එමඟින් මහජනතාවට අඩු වියදමකින් තමිල්නාඩුවට ගමන් කර පවතින නීති හා රෙගුලාසිවලට යටත්ව දැරිය හැකි මිලකට අත්‍යවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීමට හැකියාව ලබා දී ඔවුන්ගේ ජීවනෝපායන් වැඩිදියුණු කළ හැකි හෙයින් ද තලෙයිමන්නාරම-රාමේෂ්වරම් බෝට්ටු සේවාව ආරම්භ කිරීම සඳහා රජය වහාම පියවර ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 92/2025

ගරු අරවින්ද සෙනරත් මහතා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වන මතු දැක්වෙන සංශෝධනය පිළිගත යුතු ය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) පළමුවැනි ඡේදයට ඉක්බිතිව ම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමට:—**

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතල මූල්‍ය වංචා හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය.

---